**නානාට්ටාන් ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**මන්නාරම දිස්ත්‍රික්කය**

**----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2020 ජූනි 29 දින හා 2020 ජූලි 17 දින සභාපතිවරයාට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නානාට්ටාන් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 3.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සභාව විසින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මෙම ප්‍රතිපත්ති වැරදි ගණනය කිරීම්වල සඳහන් නොවේ. එය අනාගතයේදී අනාවරණය කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

#### (ආ) ගණකාධිකරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් 2018 වර්ෂයේදී ට්‍රැක්ටරය මිලදී ගෙන නොතිබුණද, ප්‍රශ්නගත මුදල වූ රු. 2,000,000 ක් ණය හිමියාගේ ගිණුමට ගෙවිය යුතු ලෙස වැරදියට පෙන්වා ඇති අතර පුනරාවර්තන වියදම ණයහිමියාගේ ගිණුමට ඇතුළත් කර තිබුණු බැවින් ජංගම වගකීම් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | අනාගත මිලදී ගැනීම් සඳහා කරන ලද ගෙවීම් පමණක් පෙන්වා ඇත. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

(ඇ) **නොසැසඳු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් මිලදී ගත් භාණ්ඩ වර්ග දෙකේ වටිනාකම රු. 423,000 ක් වුවද වාර්ෂික ශේෂ පත්‍රයේ රු. 13,500 ක් ලෙස දක්වා තිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දේපලවල වටිනාකම රු. 409,500 කින් අඩුවී තිබුණි. | 2020 වර්ෂය සඳහා වන අවසාන ගිණුම්වල මෙම දෝෂය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. තවද, අනාගතයේදී එවැනි වැරදි වළක්වා ගැනීමට පියවර ගනු ඇත. | අදාළ ශේෂයන්හි වෙනස්කම් සැසඳිය යුතු අතර ගිණුම් නිවැරදි කිරීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ii) | වර්ෂය අවසානයේදී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් රු. 5,912,740 ක් විය යුතු වුවද, 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ රු. 5,937,647 ක් ලෙස දැක්වීම නිසා රු. 24,907 ක වෙනසක් විය. | අවසාන ගිණුම්වල ඇති දෝෂ 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | අදාළ ශේෂයන්හි වෙනස්කම් සැසඳිය යුතු අතර ගිණුම් නිවැරදි කිරීමට සුදුසු පියවර ගත යුතුය. |

## 1.4 නොසැසඳීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත 16(2) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන වාර්තාවක් සකස් කර විගණනයට ඉදිරිපත් කර තිබුණි. | නියමිත කාල සීමාව තුළ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි. | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 | වසර හතකට වැඩි කාලයක් තිස්සේ පියවා නොමැති රු.1,959,876ක අත්තිකාරම් | පළාත් පාලන කොමසාරිස් විසින් පරීක්ෂණ කමිටුවක් | නියමිත කාල සීමාව තුළ අත්තිකාරම් පියවීමට සුදුසු පියවර |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදල සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පත් කර ඇති අතර ඒ සඳහා පියවර ගනිමින් සිටී. | ගත යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | වසර 4 කට වඩා වැඩි කාලයක් ගතවී ඇති රු.1,767,198 ක ඇප තැන්පතු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විමර්ශන කමිටුව පත් කර ඇත්තේ පළාත් පාලන ප්‍රාදේශීය සහකාර කොමසාරිස් විසිනි. කඩිනමින් පියවර ගනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. |
| (ඇ) | 2017 මැයි 17 දිනැති අංක. PL/15/5/Separation/U දරන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ උපදේශය. | සභාව විසින් එකතු කරනු ලබන කසළ වර්ග කිරීම හා බැහැර කිරීම සඳහා ක්‍රියා පටිපාටියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිසි ක්‍රියා පටිපාටීන් අනුගමනය කරමින් කසළ වෙන් කිරීමට හා බැහැර කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛයට අනුව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,032,089 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,797,329 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

---------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකු ජංගම ගිණුම දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පැවති අතර එහි ශේෂය වූ රු. 44,509 ක්ද අක්‍රියව පැවතීම සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ අවසරය ඇතිව ගිණුම වැසීමට පියවර ගනිමින් සිටී. | දිගුකාලීන අක්‍රිය ජංගම ගිණුම සඳහා සුදුසු පියවර ගත යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 357,200 | - | 347,800 | 352,000 | 599,480 | 247,480 |
| කුලී | 6,282,400 | 435,710 | 978,067 | 14,194,766 | 17,373,534 | 3,178,768 |
| බලපත්‍ර ගාස්තු | 395,000 | - | 620,997 | 585,000 | 554,457 | (30,543) |
| වෙනත් ආදායම් | 4,004,483 | - | 288,347 | 5,331,220 | 7,460,618 | 2,129,398 |
| | **11,039,083** | **435,710** | **2,235,211** | **20,462,986** | **25,988,089** | **5,525,103** |

### 2.3.2 කුලී

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පසුගිය සිව් වසර තුළ වෙළඳපොල සාප්පු සහ එළවළු කඩ වලින් හිඟ කුලී රු. 221,560 ක් අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | පර්යේෂණ නිලධාරීන් ලවා විමර්ශනය කර නිරාකරණය කිරීමට පියවර ගනිමින් සිටී. | නියමිත කාල සීමාව තුළ හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

### 2.3.3 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු. 25,219,634 ක් වූ උසාවි දඩ සහ රු. 3,821,736 ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | අය කිරීමට පියවර ගෙන තිබේ. | නියමිත කාල සීමාව තුළ හිඟ මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සුභසාධනය, පහසුකම්, මහජනතාවගේ සෞඛ්‍ය සම්පන්න පරිසරය, පොදු පහසුකම් සහ පොදු මහාමාර්ග, මහජන සෞඛ්‍ය සම්බන්ධ කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සභාව විසින් ඉටු කළ යුතු යුතුකම් සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

#### (අ) තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 23 දිනැති අංක. General/2018/61 දරන විගණකාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව සාගර හා සාගර සම්පත් ආරක්ෂා කරන අතරම තිරසාර සංවර්ධනය සඳහා තිරසාර දැනුවත්භාවය සහ සමුද්‍රීය හා සමුද්‍ර දූෂණය පාලනය කිරීමේ සැලසුම් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. | තිරසර සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සහ මුහුදු හා මුහුදු සම්පත් ආරක්ෂා කිරීම සඳහා සුදුසු සැලසුම් සකස් කිරීමට පියවර ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සභාවේ JCB වාහන කුලියෙන් ලැබිය යුතු රු. 41,300 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ මුදල් එකතු කිරීමට සුදුසු පියවර ගනු ලැබේ. | හිඟ මුදල් එකතු කිරීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සභාව සතු සංස්කෘතික ශාලාව කුලියට දීමෙන් ලැබිය යුතු රු. 50,000 ක් පසුගිය වසර දෙක තුළ ලැබී නොමැති බව නිරීක්ෂණය විය. | හිඟ මුදල් එකතු කිරීමට සුදුසු පියවර ගනු ලැබේ. | හිඟ මුදල් එකතු කිරීමට සුදුසු පියවර ගත යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම් වලින් ආදායම් ලබා ගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් අරමුදල් සපයන ලද තෙක්කම් ආපන ශාලාව අළුත්වැඩියා කිරීම සඳහා මරියාල් ප්‍රජා මධ්‍යස්ථානයට රු. 94,103 ක් ගෙවා ඇති අතර එය 2019 මාර්තු 07 දින අවසන් කර ඇතත්, මේ දක්වා කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. | ගොඩනැගිල්ල භාවිතා කිරීම සඳහා සුදුසු පියවර ගත යුතුය. |

### 3.3.2 අත්පත් කර නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 අයවැයෙන් සභාවේ ඉඩම් ගොඩනැගිලි ලෙස පෙන්වා ඇති රු. 309,623,434 ක් වටිනා ස්ථාවර වත්කම් සනාථ කිරීම සඳහා ඉඩම්වල අයිතිය තහවුරු කිරීමට අදාල කිසිදු ලේඛනයක් සභාවේ නොතිබුණි. | ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. | පවරා නොගත් ඉඩම්වල අයිතිය පවරා ගැනීමට සුදුසු පියවර ගත යුතුය. |

### 3.3.3 වාහන භාවිතය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජුලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. 02/2015 ට අනුව, භාවිතයට නොගත් රු. 202,000 ක් වටිනා වාහන දෙකක් අලුත්වැඩියා කිරීමට හෝ ඉවත් කිරීමට සභාව විසින් කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත. | චක්‍රලේඛයට අනුව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

### 4.1 අයවැය පාලනය

------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------ | ---------------------------- | ----------- |
| මණ්ඩලයේ ඇස්තමේන්තුගත පිරිවැය සහ සැබෑ පිරිවැය අතර වෙනස සියයට 7 සිට සියයට 66 දක්වා පරාසයක පවතින බැවින් මෙම අයවැය අකාර්යක්ෂම අයවැයක් ලෙස පෙන්නුම් කරණු ඇත. | අනාගතයේ දී එවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගත යුතුය. | ගිණුම්කරණ ඵලදායී පාලන කාරකයක් ලෙස අයවැය සකස් කිරීමට කටයුතු කළ යුතුය. |